# අපේ ප්‍රාථමික මූලාශ්‍රයවලින් ගිලිහී ගිය දේශීය ජන ශිෂ්ටාචාරය

කේ. ටී. එම්. බණ්ඩාර
විශේෂවේදී තෙවන වසර
ඉතිහාස අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
www.thilakmayurasiri7@gmail.com

**සංක්ෂේපය**

ප්‍රාග් ඓතිහාසික මානවයාගේ පූර්වාරම්භයට හා ප්‍රභවයට නිවහනක් පවා වූ මෙරට ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නෙ ක්‍රි.පූ. 3 වන සියවසේ සිට යැයි දැනට විශ්වාස කරන මතයයි. දීපවංසය, මහාවංසය ප්‍රමුඛ මෙරට මූලාශ්‍රයවලට අනුව මෙරට ස්ථිර වශයෙන් ජනාවාස ආරම්භ වන්නේ ආර්යාගමනයත් සමඟ ය. විජයාගමනයට පෙර මෙරට දියුණු ශිෂ්ටාචාරාත්මක ජන සමාජයක් තිබූ බව පැහැදිලිය.

ප්‍රාථමික මූලාශ්‍රය තුළින් ගිලිහී ගිය මෙරට දේශිය ජන ශිෂ්ටාචාරය පිළිබඳව පිරික්සීම, වංශකතාකරුවා ගොඩනැගූ ඉන්දියානු රාජ්‍යයට වඩා ඉන්දියානු සංක්‍රමණ හරහා වන ගත වූ මෙරට දේශිය ශිෂ්ටාචාරය තුළ තිබූ ශිෂ්ට බව, තාක්ෂණය හා ආර්ථිකය, දේශපාලන කරුණු පිළිබඳව විශ්ලේෂණයක යෙදීම මෙහි අරමුණ වේ. මෙම අධ්‍යනයේදී ක්ෂේත්‍ර ගවේශණ සහ ප්‍රාථමික, ද්විතීය මූලාශ්‍රය යොදා ගනු ලබයි. විදේශිකයන් සමඟ ගනුදෙනු කිරීමේදී ආනයන අපනයන භාණ්ඩ හුවමාරුව දියුණු ආර්ථික ක්‍රමයක් විජයාගමනයට පෙර මෙරට තුළ තිබී ඇත. සතුන් ඇති කිරීම, භූගත ගබඩා, වස්ත්‍රාභරණ භාවිතය, නගර නිර්මාණය, ආවාහ විවාහ චාරිත්‍රය, දියුණු ආයුධ හා දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් විජයාගමනයට පෙර වූ දේශීය සමාජය තුළ තිබී ඇත. වංශකතාවේ සැඟවී ගිය මෙරට දේශීය සමාජය තුළ සමකාලීන ආර්ය සමාජයේ පවා නොතිබුණු ඇතැම් ලක්ෂණ පැවති බවට නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :- ප්‍රාථමික, මූලාශ්‍රය, ශිෂ්ටාචාරය**